# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## රාජ්‍ය සේවක සංවර්ධන පදනම
## (සංස්ථාගත කිරීමේ)

**රාජ්‍ය සේවක සංවර්ධන පදනම සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා විසින්
2013 ඔක්තෝබර් මස 23 දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 ඔක්තෝබර් මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[274 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## රාජ්‍ය සේවක සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

**රාජ්‍ය සේවක සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

ශ්‍රී ලංකා පළාත් පාලන සේවක මහා සංගමය මගින් රාජ්‍ය සේවක සුභසාධනය සහ ආර්ථික සංවර්ධන කාර්යයන් ඉටු කිරීම සඳහා රාජ්‍ය සේවක සංවර්ධන පදනම නමින් පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී පදනම සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංස්ථාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංස්ථාව මගින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකරගෙන ගොස් ඇති හෙයින් ද, සහ ඒ සංස්ථාව රාජ්‍ය සේවක සංවර්ධන පදනම යනුවෙන් සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2013 අංක දරන රාජ්‍ය සේවක සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

රාජ්‍ය සේවක සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

**2.** මෙහි මින් මතු ‘‘සංස්ථාව’’ යනුවෙන් සඳහන් කරනු ලබන රාජ්‍ය සේවක සංවර්ධන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු ‘‘සංස්ථාව’’ යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කරනු ලබන සාමාජිකයන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු රාජ්‍ය සේවක සංවර්ධන පදනම යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතුය. පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇති අතර, ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය.

2—PL 007606 — 75 (2013/09)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මධ්‍යම රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවකයින්ගේ ද, මධ්‍යම රාජ්‍ය සහ පළාත් රාජ්‍ය විශ්‍රාමිකයින්ගේ ද ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා වූ සුබසාධන සේවා සහ ණය පහසුකම් ලබා දීම ඇතුළු සංවර්ධනාත්මක කාර්යයන් ඉටු කිරීම ;

(ආ) රැකියා උත්පාදනය පිණිස වූ කර්මාන්ත හා සේවා ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම ;

(ඇ) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි මේ හා සමාන ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය.

(අ) සංස්ථාවේ කාර්යයන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මුදල් නීත්‍යානුකූල බැංකු සහ මූල්‍ය ආයතන මගින් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ආ) ශ්‍රී ලංකාවේ දී හෝ ඉන් පිටත දී හෝ යම් තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීම ;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීමේ, බැංකු ගිණුම් පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාරගැනීම සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කරගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත්කරගනු ලබන සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත වන (මෙහි මින් මතු අධ්‍යක්ෂ මණ්ඩලය

යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී ධුර දැරුවා වූ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙම සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට අනනුකූල නොවන රීති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සුදුසුකම්, පත්කිරීම්, ඉවත්කිරීම් දීමනා සහ ගමන් ගාස්තු ගෙවීම, කාර්යය මණ්ඩලයේ පත්කිරීම්, සුදුසුකම්, විනය කටයුතු, වැටුප් හා වේතන ඇතුළු දීමනා ගෙවීමට අදාල වන සියලු රීති ;

(ආ) පනතේ සඳහන් පොදු පරමාර්ථ ඉටුකිරීමට, පවත්වාගෙන යාමට සහ ආරක්ෂා කර ගැනීමට අදාල වන සියලුම රීති ;

(ඇ) පනතේ සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම පවත්වාගෙන යාම සහ ආරක්ෂා කර ගැනීමට අදාල වන සියලුම රීති ;

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම, වාර්තා, පොදු පරිපාලන කටයුතු, ගිණුම්, විගණන කටයුතු, මූල්‍ය ප්‍රකාශ, නීති සහ ලේඛන පවත්වාගෙන යාමට අදාල වන සියලුම රීති .

(2) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් සාදන ලද රීති එම උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන්ම, එවැනිම රැස්වීමක දී කලින් කල වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. තෑගි, තෙස්තමේන්තු නීයාදන, මාරු කිරීම්, පරිත්‍යාග, හෝ දායක මුදල් වශයෙන් ලැබෙන සියලු මුදල් සංස්ථාවේ කර්මාන්ත හා සේවා

වලින් ලැබෙන ආදායම් සහ කවර වුවද දේපලක් විකුණා ලබන මුදල් සංස්ථාව විසින් තීරණය කරනු ලබන, සංස්ථාව නමින්, බැංකු එකක හෝ වැඩි ගණනක තැන්පත් කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ දේපල පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා ක්ෂය වීමේ අරමුදලක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලුම වියදම් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් නිශ්චල සහ චංචල දේපල දරනු ලැබිය හැකි බව.**

**8.** යම් මිලදී ගැනීමක්, දායක මුදලක්, තෑග්ගක්, ප්‍රදානයක් හෝ තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලබන යම් නිශ්චල හෝ චංචල දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය සහ ශක්නුතාව ඇති අතර, ඒ දේපල විකිණීමට, උකස් කිරීමට, බදු දීමට හුවමාරු කිරීමට, අන්‍යාකාරයකින් නියාදනය කිරීමට තත්කාලයේ සංස්ථාවේ බලපවත්නා නීතිවලට යටත් ව මේ පනතේ කාර්යය සඳහා, සංස්ථාව විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය.

**සාමාජිකයින්ගේ වගකීම් සීමා කිරීම.**

**9.** සංස්ථාවේ කිසිම සාමාජිකයෙක් ඔහුගෙන් සංස්ථාවට වාර්ෂිකව අයවිය යුතු සාමාජික ගාස්තු ඉක්මවන කිසිදු දායක මුදලක් සංස්ථාවේ ණය හෝ බැරකම් බේරුම් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවන්නේ ය.

**සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය සහ දේපල.**

**10.** (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ පැවති පදනමේ සියලුම දේපල, ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු ණය ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලබිය යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පවත්වාගෙන යනු ලැබූ රාජ්‍ය සේවක සංවර්ධන මුල්‍ය පදනමේ පහත සඳහන් දේපල සහ ව්‍යාපාර මෙම පනත මගින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව වෙත පැවරෙනු ඇත.

(අ) මහියංගනය සොරබොර ජනපදයේ හත්දැත්තෑව ග්‍රාමයේ අංක 94 දරණ ස්ථානයේ පිහිටි අක්කර 01 ක පිහිටි ඉඩම සහිත වැලි ගොඩදැමීමේ ව්‍යාපෘතිය ;

(ආ) පොල්ගහවෙල මැතිවරණ කොට්ඨාශයේ කොහොඳපොල ග්‍රාමයේ පිහටි පර්චස් 8 ක ප්‍රමාණයේ වූ ඉඩම සහිත යාන්ත්‍රික වඩු වැඩපොළ පිහිටි ගොඩනැගිල්ල ;

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපල.

**11.** සංස්ථාව ගණන් බේරා වසා දමනු ලැබූ විට හෝ විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලු ණය සහ බැරකම් බේරුම් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වේ නම් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ ලාබයක් තම සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද වෙනත් ආයතනයකට හෝ ආයතනවලට එම දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ගිණුම් කටයුතු.

**12.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම්, බැරකම් හා සංස්ථාවේ සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් කටයුතු තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මෙම වගන්තියේ ‘‘සුදුසුකම් ලත් විගණකවරයා’’ යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා

නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

යන්නෙන් අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාවේ මුද්‍රාව සභාපතිවරයා හෝ කළමනාකාර අධ්‍යක්ෂ හෝ සභාව විසින් යථා පරිදි බලය පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ ඉදිරියේ දී මිස කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සනකට පරිබාහිර විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.